# පුරවැසි අධ්‍යාපනය I, II

**7 ශ්‍රේණිය** **දෙවන වාර පරීක්ෂණය - 2017**

## පුරවැසි අධ්‍යාපනය I

## ලකුණු දීමේ පටිපාටිය

| | |
|---|---|
| 01 | (2) |
| 02 | (2) |
| 03 | (1) |
| 04 | (3) |
| 05 | (4) |
| 06 | ✓ |
| 07 | × |
| 08 | ✓ |
| 09 | × |
| 10 | × |
| 11 | ක්‍රීඩා සංවිධාන |
| 12 | අධ්‍යාත්මික |
| 13 | අයිතිවාසිකම් |
| 14 | සමාජ |
| 15 | අභියෝග |
| 16 | (III) |
| 17 | (IV) |
| 18 | (V) |
| 19 | (I) |
| 20 | (II) |

## පුරවැසි අධ්‍යාපනය II

## ලකුණු දීමේ පටිපාටිය

01. (i) මව පියා දරුවන් පිය පාර්ශවයේ ඥාතීන් මව් පාර්ශවයේ ඥාතීන් කිහිපදෙනෙක් එකට ජීවත්වන පවුල් ඒකකයකි.

(ii)
- ★ පවුලේ ශක්තිය වැඩිවීම
- ★ ශ්‍රමය ලබාගැනීමේ පහසුව
- ★ දරුවන්ට දෙමව්පියන්ගෙන් වෙන් ව සෙසු සාමාජිකයන්ගේ ආදරය, ආරක්ෂාව, සෙනෙහස ලැබීම
- ★ වැඩිහිටි සාමාජිකයින්ට සෙසු අයගේ ආදරය ආරක්ෂාව ලැබීම
- ★ බාල පරපුරට සංස්කෘතිය පවරා දීම
- ★ වගකීම් බෙදීයාම
- ★ දරුවන් රැක බලා ගැනීමේ අයිතිය හා වගකීම් සාමාජිකයන් අතර බෙදීයාම
- ★ බාහිර ජන සමාජය සමඟ පුළුල් සබඳතා ගොඩ නගා ගැනීමට හැකි වීම

(iii)
- ★ ඥාතිත්වය මත ගොඩ නැගීම
- ★ න්‍යෂ්ටික පවුල සුළු සාමාජික සංඛ්‍යාවක් ද විස්තෘත පවුලක වැඩි සාමාජික සංඛ්‍යාවක් ද පවතී.
- ★ සාමාජිකයන් එක් වාසස්ථානයක ජීවත් වීම
- ★ සාමාජිකයින් අතර සමීප සබඳතා

02. (i)
- ★ දිනපතා පාසල් යාම
- ★ ගුරුවරුන්ට කීකරු වීම
- ★ ගුරුවරුන් දෙන උපදෙස් පිළිපැදීම
- ★ හොඳින් අධ්‍යාපන කටයුතුවල නිරතවීම
- ★ කාලසටහනකට අනුව අධ්‍යාපන කටයුතුවල නිරත වීම
- ★ අඩු සාධන මට්ටම් පෙන්නුම් කරන විෂයන් හඳුනාගැනීම
- ★ එම විෂයන් සඳහා වැඩි උනන්දුවකින් කටයුතු කිරීම

(ii)
- ★ යහපත් සිතුම් පැතුම්
- ★ ආචාරධර්ම
- ★ හොඳ සිරිත් විරිත්
- ★ හොඳ අධ්‍යාපනයක් ලබාගැනීම

(iii)
- ★ පුස්තකාලය
- ★ ප්‍රජා සංවර්ධන සමිති
- ★ මත්ද්‍රව්‍ය නිවාරණ ආයතන
- ★ අමද්‍යප ව්‍යාපාරය
- ★ පරිසර සංරක්ෂණ ආයතන ආදිය

03. (i) සොඳුරු ගුණ නුවණ යුතු උතුමෝ පතර
නපුරු දුදන සහ එක් වුව වෙති අසර
රුදුරු කටු පමණ නැති සමතල හසර
අඳුරු සමඟ වූ කල වේය බියකර

(ii)
- ★ ජය පරාජය සතුටින් විඳ දරා ගැනීම
- ★ නීතිගරුක වීම
- ★ සාධාරණත්වය අගය කිරීම
- ★ විධාන පිළිපැදීම
- ★ කණ්ඩායම් හැඟීමෙන් යුතුව කටයුතු කිරීම

(iii) විනෝදය, වින්දනය, සිතුවිලි පාලනය, චිත්ත සංගමය, විවිධ අවස්ථා, සෞන්දර්යාත්මක ව දැකීම වැනි දෑ ඇතුලත් විය යුතු ය.

04. (i)
- ★ දෙමාපියන්ගේ ආරක්ෂාව රැකවරණය අහිමි වීම
- ★ දෙමාපියන්ගේ ආදරය, කරුණාව නිසි පරිදි විඳ ගැනීමට දරුවන්ට අවස්ථාව නොලැබීම
- ★ පවුලේ සාමාජිකයන්ගේ රැකවරණය සඳහා බාහිර පුද්ගලයන්ගේ සහය ලබාගැනීමට සිදු වීම

(ii)
- ★ ස්වයං විනය
- ★ නායකත්වයට ගරු කිරීම
- ★ පොදු දේපල ආරක්ෂා කිරීම
- ★ සහයෝගයෙන් කටයුතු කිරීම
- ★ සාකච්ඡා මගින් තීරණවලට එළඹීම
- ★ සරල දිවි පැවැත්ම
- ★ අවංක බව
- ★ ඉවසීම වැනි

(iii) යහපත් ජීවිතයක් ගත කිරීමට අන් අයගෙන් ඔබට ලැබෙන හිමිකම අයිතිවාසිකම් නම් වේ.

- ★ ආහාර හා පෝෂණය
- ★ සෞඛ්‍යය පහසුකම්
- ★ ඇඳුම් පැළඳුම්
- ★ නිවාස පහසුකම්
- ★ දෙමව්පියන්ගේ ආදරය, දයාව, සෙනෙහස
- ★ අධ්‍යාපනය ලබාදීම ආදිය

05. (i)
- ★ දරුවන් පෝෂණය
- ★ දරුවන් ආරක්ෂා කිරීම
- ★ අධ්‍යාපනය ලබාදීම
- ★ ලෙඩරෝග වලින් ආරක්ෂා කිරීම ආදිය

(ii)
- ★ විභාගයට නැවත සූදානම් වීම
- ★ වෘත්තීය පාඨමාලාවක් හැදෑරීම
- ★ තම හැකියා දක්ෂතා ඇති අංශයක් දියුණු කරගැනීම
- ★ ස්වයං රැකියාවක් කිරීම

(iii) ★ අනාගතය සුබවාදී යැයි සිතීම ★ පවත්නා තත්ත්වය පිළිබඳ සෑහීමකට පත්වීම

★ දැඩි කුතුහලයකින් සිටීම ★ නිරීක්ෂණශීලී වීම

★ විකල්ප සලකා බැලීම ★ අනාගතය ගැන සිහින දැකීම

★ උනන්දුව වැඩි වීම ★ නරක පුරුදු හඳුනාගත හැකි වීම

★ නිදහස් ව සිතීම ★ ප්‍රායෝගික ව ප්‍රශ්න සඳහා නව විසඳුම් ලබාදීම

06. (i) ★ ජීවත්වීමේ අයිතිය ★ අධ්‍යාපනය ලැබීමේ අයිතිය

★ කැමති ආගමක් ඇදහීම ★ අදහස් ප්‍රකාශ කිරීම

★ රැකියාවක් කිරීම ★ සමානාත්මතාවය

★ කැමති තැනක ජීවත් වීම

(ii) ★ අධ්‍යාපනය ලැබීම - හොඳින් ඉගෙන ගැනීම

★ කැමති ආගමක් ඇදහීම - වෙනත් ආගමික කොටස්වලට හිරිහැර නොකිරීම

(iii) ★ යුතුකම් ඉටු කිරීම ★ නීතිගරුක බව

★ චාම් දිවි පැවැත්ම ★ අන්මත ඉවසීම

★ අන් අයට ආදරය කිරීම ★ දයාව කරුණාව

★ අවංක බව ★ අයිතිවාසිකම්වලට ගරු කිරීම

ආදිය ඇතුලත් විය යුතුයි

07. (i) සාප්පු හා කාර්යාල පනත

(ii) ★ කායික හා මානසික ශක්තිය පිරිහීමෙන් රෝගී වීම

★ ශ්‍රමය සූරා කෑමට ලක්වීම

★ අපයෝජනයන්ට ලක්වීම

★ ඉගෙනීමට ඇති අවස්ථා අහිමි වීම

★ සුන්දර වූ ළමා කාලය අහිමි වීම

(iii) ★ විනෝදාංශවල යෙදීම

★ පවුලේ කටයුතුවලට සහය වීම

★ නිර්මාණකරණයට යොමු වීම

★ තම අත්දැකීම් බෙදා හදා දීම

***